# A Source Study of the Utility of Logic in Buddhism

බුදුසමය තුළ තර්කයෙහි උපයෝගිතාවය පිළිබඳ මූලාශ්‍රයාගත අධ්‍යයනයක්

Karapikkada Sobitha

බුදුසමයේ බොහෝ සූත්‍ර දේශනාවන්ට අනුව තර්කය ප්‍රතික්ෂේපිත වූ ඥාන මාර්ගයක් ලෙස දක්වා ඇත. නමුත් මේ පිළිබඳව විමර්ශනාත්මකව බැලීමේ දී, බුදුසමය තුළ තර්කයේ උපයෝගිතාවයන් ද අවධාරණය වී ඇති අයුරු දැකගත හැකි වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් තර්කය පිළිබඳ බෞද්ධ ආකල්පය කෙබඳුදැයි අධ්‍යයනය කරනු ලබයි.

පාලි මූලාශ්‍රය තුළ හමුවන්නා වූ **'තක්ක'** යන පදය ඇසුරෙන් වර්තමානයේ **"Logic"** යන්න නිර්මාණය වී ඇති අතර, මෙය තුළින් **''ශබ්ද විද්‍යාව''** **''වචන විද්‍යාව''** **''තර්ක ශාස්ත්‍රය''** **''න්‍යාය ශාස්ත්‍රය''** ආදී අර්ථ ගෙනදෙයි. පාලි '**තක්ක**' ධාතුව තුළින් ද අර්ථවත් වනුයේ **තර්ක කිරීම**, **විතර්ක කිරීම, කතා කිරීම** ආදියයි. **(තක්කේ, විතක්කේ, භාසායං)** යනාදිය යි. පාලි මූලාශ්‍රය තුළ **තක්ක** යන්නට පර්යාය පද ලෙස **විතක්ක, සංකප්ප** යන පද යෙදී ඇත. **(කතමො තස්මිං සමයෙ විතක්කො හොති යො තස්මිං සමයෙ තක්කො විතක්කො සංකප්පො)**

තර්කයේ ආරම්භය මනුෂ්‍ය චිත්ත, චෛතසිකයන්ගේ ආරම්භය දක්වාම දිවයන බව සිතිය හැක. වෛද වෛදික, ග්‍රන්ථ අධ්‍යයනයේ දී තර්කනය හා සම්බන්ධ වූ **'බ්‍රහ්මෝද්‍ය'** (Religious Charade debate on metaphysical topics), **'කථෝද්‍ය'** (The institution of the debate) යනුවෙන් පද දෙකක් හමු වේ. බ්‍රහ්මෝද්‍ය යනු ගුප්ත ප්‍රශ්න හා සාකච්ඡාවන්ය. එය සංවාද ස්වරූපයෙන් සිදු වී ඇති අතර ඒ සඳහා **'වාකෝවාක්‍ය'** හෙවත් තර්කානුකූල ප්‍රකාශනයන් යොදාගෙන ඇත. **(වාකෝ වාක්‍යං බ්‍රහ්මෝද්‍යං වදන්ති)** මෙහි සංවර්ධනයක් ලෙස පසුකාලීනව කථෝද්‍ය හෙවත් නොයෙකුත් විවාදයන් (Dispute) හා කලහයන් (Quarrel) නිර්මාණය විය. **(කාතොජ්ජං උච්චති කළහො..... විවාදො)**

මෙසේ ආරම්භ වූ තාර්කික පදනම ප්‍රාග් බෞද්ධ යුගයේ මිනිසා පසුකාලීනව නොයෙකුත් අරමුණු පදනම් කොටගෙන භාවිත කොට ඇත. ඒ අතර සත්‍ය විවරණය කිරීමට උත්සහ දැරීම, අනුන්ගේ මත තර්කනය නැමැති අවියෙන් බිඳ හෙලීමට උත්සහ දැරීම, තමන් එල්බගත් මතය විශ්වාසනීයත්වයෙන් ඉදිරිපත් කිරීම, ජයග්‍රහනය පිණිස යනාදිය දැකගත හැකිය.

තර්කනය බුද්ධ කාලීන සමාජය තුළ ද ප්‍රබලව දක්නට ලැබුණු ඥාන මාර්ගයකි. බොහෝ මූලික සූත්‍රදේශනා තුළ **තක්කී, විමංසි** යන පදයන් හමු වේ. එසේම **''වාදසීලා''** යනුවෙන් පදයක් ද ඇතැම් සූත්‍ර දේශනාවල දැක්වේ. මේ සියල්ලෙන් දක්වා ඇත්තේ තර්කය සඳහා යොමුව කටයුතු කළ පිරිසය. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයේ හමුවන දෙසැටක් මිත්‍යාදෘෂ්ඨී අතර සිව්වන, අටවන, දොළොස්වන, අටළොස්වන දෘෂ්ඨීහු තර්කනය පදනම් කොටගත් ඒවාය. බුදුරජාණන් වහන්සේ මේවා හඳුන්වා ඇත්තේ **'පරප්‍රවාද'** යන නාමයෙනි. **(සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ)**

ම.නි. සංගාරව සූත්‍රයට අනුව තත්කාලීන චින්තකයින් ඥාන විභාගය සඳහා උපයෝගී කොටගත් මාර්ග තුනක් දක්වා ඇත. සම්ප්‍රදාය වාදීන් **(අනුස්සවිකා)** බුද්ධිවාදීන් **(තක්කී වීමංසී)** අනුභූතිවාදීන් **(පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමඤ්ඤෙව අභිඤ්ඤාය)** එයින් බුද්ධිවාදීහු උපයෝගී කොටගත් මාර්ගය වනුයේ තක්කී වීමංසි ක්‍රමයයි. එනම් තර්කය මත පදනම්ව ඥාන ගවේෂණය කිරීමයි. අං.නි. තික නිපාතයේ දක්වෙන කාලාම සූත්‍රය තුළ, **තක්කහේතු, නයහේතු, ආකාරපරිවිතක්ක, දිට්ඨිනිජ්ඣානඛන්ති** යන ඥානමාර්ග සතර ද තර්කය පදනම් නිර්මාණය වූවක් බව දක්වේ.

තර්කය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බැලීමේ දී, ඥානගවේෂණය තුළ තර්කය **සප්‍රමාණ කරුණක් නොවන බව** අං.නි. කාලාම සූත්‍රය තුළ අවධාරණය වේ. **(මා තක්ඛහේතු)** ඥානගවේෂණය තුළ තර්කය සප්‍රමාණ නොවන්නේ තර්කය තුළින් නිවැරදි නිගමනයන්ට මෙන්ම වැරදි නිගමනයන්ට ද එළඹීමට ඇති ප්‍රවණතාවය පදනම් කොටගෙන ය. මේ අනුව බුදුසමය තර්කය තුළ දක්නට ලැබෙන අවස්ථා හතරක් පෙන්වා දෙයි. **සුතක්කිතම්පි හොති** (නිවැරදි තර්ක, නිවැරදි දැනුම) **දුතක්කිතම්පි හොති** (නිවැරදි තර්ක, වැරදි දැනුම) **තථාපි හොති** (වැරදි තර්ක, නිවැරදි නිගමන) **අඤ්ඤථාපි හොති** (වැරදි තර්ක, වැරදි නිගමන) එසේම තර්කය තුළින් නිර්මාණය වන්නා වූ දෘෂ්ඨිරාගය පුද්ගලයාට යථාවබෝධය සඳහා මහත් වූ බාධාවක් ලෙස බුදු සමය පෙන්නා දෙයි. එය නොයෙකුත් ගැටුම් ඇතිවීමට ද හේතු කාරකයක් වේ. **(තක්කං ච දිට්ඨීං ච යෙ අග්ගහෙසුං තෙ ගට්ඨයන්තා විචරන්ති ලොකෙ)** ම.නි. දිඝනඛ සූත්‍රයේ දී බුදුන් වහන්සේ දක්වන්නේ පුද්ගලයා ස්ව මතය සත්‍යය ය, අනෙක් මත අසත්‍යය ය යැයි සිතීමෙන් **(ඉමං දිට්ඨීං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරෙය්‍ය ඉධමෙව සච්චං මොඝ මඤ්ඤනති)** ප්‍රතිවාදීන් ලෙස කලහයට විවාදයට පත්වීමට සිදුවන බවයි. එසේම තර්කය සත්‍ය නොවූ, සප්‍රමාණ වූ කාරණාවක් වන බැවින් තර්කය මත පිහිටා සත්‍ය බහුත්වයක් නිර්මාණය විය හැකිය. එය ද පුද්ගලයා මන්මුලා බවට පත්කරවන්නා වූ සාධකයක් ලෙස බුදු දහම පෙන්වා දෙයි.

තර්කයේ මාධ්‍ය භාෂාවයි. එය භාෂාව පදනම්ව පවතියි. නමුත් බුදු සමය පෙන්වා දෙන යථාවබෝධය හෙවත් ඥානය භාෂාව තුළින් නිර්වචනය කළ නොහැක්කකි. එම නිසා තර්කය යථාවබෝධය තුළ අර්ථවත් කළ නොහැක.

මෙසේ තර්කය බුදු සමයෙන් බැහැර වූ සංකල්පයක් ලෙස විග්‍රහ වී තිබුණ ද, මූලික සූත්‍රාගත හා අටුවා විවරණ අධ්‍යයනයේ දී එහි නිෂ්ප්‍රයෝජනතා මෙන්ම සප්‍රයෝජනතා ද දැකගත හැකිය.

යම් කරුණක් සකාරණව විමර්ශනය කිරීමේ දී, එහි තාර්කික බව තිබිය යුතු බවත්, යම් කරුණක් අනෙකෙකුට ප්‍රකාශ කිරීමේ දී එහි පැහැදිලි විධිමත් භාවයක් තිබිය යුතු බවත් බුදුසමය පිළිගනී. එනයින් බුදුරජාණන් වහන්සේ ද කිසිවිටෙක අහේතුකවූත්, අකාරණවූත් දෙයක් නොපිළිගත්හ. උන් වහන්සේ කරුණක් පැහැදිලි කිරීමේ දී ඊට අදාළ වූ විවරණ මෙන් ම උපමා උදාහරණයන් ද පෙන්වා දෙයි. එය තාර්කික වූ දේශනා විලාශයකි. දී.නි. කස්සපසීහනාද සූත්‍රය, ම.නි. නිවාප සූත්‍රය ආදී සූත්‍රයන්ට අනුව ප්‍රථම ධ්‍යානයට සමවත් වූ පුද්ගලයාට තම සිත තුළ ඇතිවන සිතුවිලි පාලනය කරගැනීමට තර්කය උපයෝගී වන බව දක් වේ. **(සවිතක්කං සවිචාරං විවේකජං පිතිසුඛං පඨමජ්ඣානං)** එසේම **"විචෙසො මයා භික්ඛවෙ ධම්මො දෙසිතො"** යන්නට අනුව බුදුරජාණන්

වහන්සේ ධර්මය දේශනා කොට ඇත්තේ විමර්ශනාත්මකව පිළිගැනීම සඳහා ය. මෙහි විමර්ශනාත්මක බව යනු තාර්කික බවයි. මුල් බුදුසමයේ දැක්වෙන ප්‍රධාන සිද්ධාන්තයන් වන ත්‍රිලක්ෂණය, චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදන්‍යාය වැනි මූලධර්මමය දේශනාවන් න්‍යාය ශාස්ත්‍රයේ උපයුක්ත ත්‍රිරූප ලිංගයෙන් සමන්විතව දේශනා කොට ඇති අයුරු දක්නට ලැබේ. **(යම්කිසි සමුදය ධර්මයක් වේ ද, ඒ සියල්ල නිරෝධ ධර්මයෝ ය)**

බුදු සමයේ පරම නිෂ්ඨාව ලෙස දැක්වෙන්නේ විමුක්තියයි. එය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් ලැබිය යුත්තකි. නමුත් එය අනුන්ට පැහැදිළි කරදීමේ දී තර්කය උපයෝගී කොට ගත හැක. තර්ක ශාස්ත්‍රයේ දී මෙය **පරාර්ථානුමානය** ලෙස දක්වා ඇත. එසේම සුත්ත නිපාතය තුළ ද පුද්ගලයාට සත්‍ය බව හා අසත්‍ය බව වෙන් කොට හඳුනා ගැනීමට තර්කය උපයෝගී වන අයුරු විග්‍රහ වේ. **(තක්කං ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසා ඉති ද්වය ධම්මමාහු)** බුදුරජාණන් වහන්සේ ද සත්‍ය මත පිහිටා කටයුතු කරන්නේ නම්, තමන් වහන්සේ ද වාද කිරීමට කැමති බව උපාලි පිරිවැජියාට දක්වා ඇත. **(සචෙ ඛො ත්වං ගහපති සච්චෙ පතිට්ඨාය මන්තෙය්‍යාසි සියා නො එත්ථ කථාසල්ලාපොති.)** මෙසේ බුදුරජාණන් වහන්සේ දක්වනුයේ මෙම තාර්කික සාකච්ඡාව ප්‍රඥාව වෙත යොමු විය හැකි මාර්ගයක් බැවිනි. **(සාකච්ඡාය පඤ්ඤා වේදිතබ්බො.)**

මෙසේ උක්ත කාරණාවන්ට අනුව තර්කය බුදු සමයෙන් සෘජු ලෙස ප්‍රතික්ෂේපිත වූ ඥානමාර්ගයක් ලෙස පෙන්වා දිය නොහැක.

ප්‍රමුඛ පද ; තර්කය, ඥානය, ප්‍රත්‍යක්ෂය, සප්‍රයෝජනතා, දෘෂ්ඨිය.